සඳැස් කවියට අත්වැලක්



ආචාර්ය
ඥානතිලක හේවාගමගේ

සිව්වැනි කොටස:

# ය ව හ න්, මුල් ගුර බිඳීම, සහ අග පෙළ සිඳීම දෝෂ

මෙම ලිපි පෙළේ තෙවැනි කොටසේ දී අපි සලකා බැලුවේ සිව්පද විරිත්වල මූලික ලක්ෂණ සහ එහි එන මුල් විරිත් කිහිපයක් පිළිබඳවය. එම විමසීම අනුව සිව්පදයක ප්‍රධානතම ලක්ෂණයක් වන්නේ එළිසමයයි. තව දුරටත් සිව්පද විරිත් විමර්ශනය කිරීමට ප්‍රථම එළිසමය සහිත සිව්පද විරිත්වලට අදාල ප්‍රධාන ගනයේ දොස් කිහිපයක් පිළිබඳව විස්තරාත්මක කරුණු දැක්වීමක් මෙහිදී කරනු ඇත. කවියක සුගායනීය බව, ශ්‍රවන මාධූර්යය, ශබ්දාර්ථ යනාදිය රැක ගැනීම සඳහා සඳැස් කවි පබැඳීමේ දී එම කවි මෙම දෝෂයන්ගෙන් වියුක්ත වීම අත්‍යාවශ්‍ය වේ.

## ය ව හ න් දෝෂය

එළිසමය සහිත විරිත් කවියක හෝ සිව්පද කවියක එක් එක් පාදයේ අවසාන අකුර 'ය', 'ව', 'හ' සහ 'න්' යන අකුරු හතරෙන් එකක් වුවහොත් සම්භාව්‍ය සඳැස් කවි පැබැඳීමේ රීතීන්ට අනුව එම අකුරට ප්‍රථම අකුර පාද හතරේම සමාන විය යුතුය. සාගර පලන්සූරිය ගේ 'සුදෝසුදු' නම් කෘතියෙන් උපුටාගත් පහත සඳහන් කවිය සලකා බලන්න.

ගොඩ මඩ දෙකම සරු සාරය පලබරය
කටුරොද ගම්මානෙ තරමක පිටිසරය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙලවරය

මෙහි එක් එක් පාදය අවසන් වන්නේ 'ය' අකුරෙනි. එනිසා ය ව හ න් දෝෂයෙන් මිදීම සඳහා සෑම පාදයකම ඊට කලින් අකුර සමාන වනසේ කවිය පද බැඳ ඇත. මෙම කවියේ දී එම අකුර 'ර' යන්න වේ.

අන්තර්ජාලයෙන් හමුවූ මෙම කවිය සලකන්න.

කවදත් කොහෙත් අසමානය කවි රසය
ලැබෙනා සතුට අන් ලෙසකින් ගනු බැරිය
රුපියල් පැයවලින් බැහැ මැනුමට අගය
නොනැසී දිලේවා අපගේ හෙළ කවිය

මෙය අර්ථවත් කවියක් වුවද ඉහත සඳහන් රීතිය අනුව එය ය ව හ න් දෝෂයට හසුව ඇති බව පෙනේ. සෑම පාදයක්ම 'ය' අකුරෙන් අවසන් වුවද පාද හතරේම ඊට පෙර අකුර සමාන නොවේ.

එසේම එක් පාදයක හෝ වෙනස් අකුරක් වී නම් එම කවිය ය ව හ න් දෝෂයට හසුවූ ලෙස සැලකිල්ලට ගනු ලැබේ. විශිෂ්ඨ පද්‍ය කාව්‍ය පොත්වල පවා ය ව හ න් දොසට ලක්වුණු කවි ඉඳ හිට දක්නට ඇත.

පහත සඳහන් කවිය උපුටා ගන්නා ලද්දේ 'යසෝදරාවත' කෘතියෙනි.

එක අඹු දරු නිසා මම කල් බැඳීමය
නිම නැති සතුන් සසරින් ගොඩ ගැනීමය
අද මම මහණ වෙමි ආලය හැරීමය
පුදුම කුමරු රුව ඇති මගෙ රාහුලය

මෙහිදී අවසාන පාදයේ 'ය' යන්නට කලින් තිබෙන අකුර අනෙක් පාද තුනට වඩා වෙනස් වී ඇත. එනිසා මෙම කවිය යවහන් දෝෂයට හසුවූ කවියක් ලෙස සැලකේ. නමුත් මෙහි 'රාහුලය' ලෙස නමක් සඳහන් වන නිසා කවියේ අරුතට හානි නොවන පරිදි ය ව හ න් දෝෂය ඉවත් කිරීම අසීරු විය හැක. මෙවැනි විශේෂ අවස්ථාවල දී එය දෝෂයක් කොට නොසැලකිය යුතු බව සමහරක් විද්වතුන්ගේ මතයයි.

දැන් අපි පාදයන් 'ව' යන්නෙන් අවසන් වන කවි සලකා බලමු. පහත දැක්වෙන්නේ වෑත්තෑවේ හිමියන් කළ 'ගුත්තිල' මහා කාව්‍යයේ එන කවකි.

යොදා සවන් වෙණ නද රස සුලබව
න ඥා එකඟ සිත් වත නොම සකොබව
ස ඥා කුලය නොහැරම එන අසුබව
එ දා ගියේ රිලවුන් පන්සල් බව

මෙහිදී සෑම පාදයකම එළිසම අකුර වන 'ව' යන්නට පෙර සමාන අකුරක් ('බ' යන්න) එන ලෙස කවිය පබැඳීමෙන් ය ව හ න් දෝෂය මගහරවා තිබේ.

එදා දුන්න එළි ආලෙන් උමතුව
මෙදා පිරිහිලලු කෝලෙන් සසලව
උදා වුණත් අඹරේ පෙර පරිදිව
සඳා කිමද වැහැරී දුක් බරිතව

මෙම ලිපියේ රචකයා විසින්ම ඉහත සඳහන් කවිය පැබැඳුවේ එය ය ව හ න් දෝෂය සහිත කවියකට උදාහරණයක් ලෙස දැක්වීම පිණිසය. මෙහි එළිසම අකුර වූ 'ව' යන්නට පෙර අකුර පද්‍ය පාද හතරේම එකිනෙකට වෙනස්ය. මෙය ව්‍යංගාර්ථයකින් යුතු කවියක් වුවද ය ව හ න් දෝෂය නිසා එහි අගය හීනව ඇත.

පහත දැක්වෙන්නේ 'ගුත්තිල' මහා කාව්‍යයෙන් උපුටා ගන්නා ලද 'මහ පියුම් ගී' විරිතට (පසුව විස්තර කෙරෙනු ඇත) අයත් එළිසමය සහිත කවියකි.

නොහළ විරු සිරියහ
රිප'ඳුරට රිවි උදයහ
පබල මෙර දිරියහ
නැගී රිය රියැදුරෝ සිටියහ

මෙහි එළිසම අකුර 'හ' යන්න බැවින් ය ව හ න් දෝෂයෙන් වියුක්ත වීම සඳහා එයට පෙර අකුර සමාන වන පරිදි කවිය පද බැඳ ඇත.

හිතාමතාම ය ව හ න් දෝෂය සහිතව පහත සඳහන් කවිය පබැඳුවේ 'හ' යන්නට අදාලව ය ව හ න් දෝෂය සහිත කවියකට උදාහරණයක් පෙන්වීම සඳහාය.

මැදුරෙහි නැගි සිනහ
අතරම දුක විරහ
ඇසුනම ගෙන තරහ
රජතුමො එහි ගියහ

මෙහි එක් එක් පාදයේ එළිසම අකුර වන 'හ' යන්නට පෙරාතුව වෙනස් වෙනස් අකුරු පිහිටා ඇති හෙයින් මෙය යවහන් දෝෂය සහිත කවියකි.

දැන් අපි මෙම දෝෂය හා බැඳුණු අවසාන අකුර වන 'න්' සලකා බලමු. පහත දැක්වෙන්නේ විමලරත්න කුමාරගම කවියා විසින් රචිත 'බුදු රුව' නම් කවි පංතියේ එන කවියකි.

කිළිටි රා දොස් මෝ මුළායෙන් රුධිර පවසැති මිනිස් අතකින් 
කඩා රැස් කළ කුසුම් කුමටද කුමන පලයද කිළිටි බතකින්
පිදීමට මගෙ අහිංසාවාදී පියාණන් වියලි පතකින්
ඇහැටු පෙඳ පාසියෙන් බැරිදැයි අසමි බැතිබර නැඹුරු සිතකින්

මෙම කවියේ එළිසම වන අකුර 'න්' බැවින් සෑම පාදයකම ඊට කලින් අකුර සමාන වන සේ කවිය පබඳා ඇත. මෙනිසා මෙම කවිය ය ව හ න් දෝෂයෙන් වියුක්ත වේ.

'යසෝදරාවත' පොතෙහි එන 122 වැනි කවිය මෙසේය.

තලෙක දෙතලෙක තුන් තලෙක ඈ පිළිවෙලින් අහසේ සිටන්
ඉඳුරුපති මහ බඹ ද නා ගුරුළුන්ගෙ නන් වෙස් ගෙන සොඳින්
අවට සැදි සිටි පිරිස් හට මම යසෝදර යයි පවසමින්
සුගත සමිඳුට නොයෙක් තුති දී පෑවෙ එදවස පිරිනිවන්

මෙම සිව්පද කවියේ එළිසම අකුර 'න්' වන අතර එක් එක් පාදයේ එම අකුරට කලින් ඇති අකුර එකිනෙකට වෙනස්ය. මෙනිසා මෙම කවිය ය ව හ න් දෝෂයෙන් යුක්ත වේ.

'සිදත් සඟරාව', 'එලු සඳැස් ලකුණ' වැනි හෙළ බස සහ හෙළ සඳැස් කවිය පිළිබඳව වූ සිද්ධාන්ත පොත්වල ය ව හ න් දෝෂය පිළිබඳව විශේෂයෙන් සඳහන් කර එය මගහරවන ලෙසට උපදෙස් දී ඇත. සමහරක් ආධුනිකයින් හැරුනු විට වර්තමානයේ සිටින බොහෝ සඳැස් කවි කිවිඳියන් ය ව හ න් දෝෂය පිළිබඳව ඉතාමත් සැලකිලිමත් වන බව පෙනෙන්නට තිබේ.

## මුල් ගුර බිඳීමේ දෝෂය

පැරණි සම්භාව්‍ය සඳැස් කාව්‍ය රීතීන්ට අනුව සිව්පද කවියක මුල් පාදය ගුරු අක්ෂරයකින් ආරම්භ කර අනික් පාද එකක් හෝ කිහිපයක් ලඝු අක්ෂරවලින් පටන් ගැනීම හේතුවෙන් මෙම දෝෂය හට ගැනේ. 'සුභාෂිතය' පොතෙහි එන 20 වැනි කවිය සලකා බලමු.

පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතු මැ යැ ඉතා ගරු
එක පුන් සඳින් දුරු වෙයි ලොව ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොමැ වේය දුරු

මෙම කවියේ පළමු පාදය පටන් ගන්නේ ගුරකින් ('පින්' - හලන්න ගුරක්) වන අතර අනෙක් පාද සියල්ලම පටන් ගන්නේ ලඝු අකුරුවලිනි. එනිසා ඉහත අර්ථ දැක්වීම අනුව මෙම කවිය මුල් ගුර බිඳීමේ දෝෂයට හසුව ඇත.

එසේම 'අඳුර අපේ දුක නිවාවි' කවි පංතියේ එන කවියක් සලකා බලමු.

හැන්දෑවට උඹ ඉඳගෙන තලු ගහනව මට ඇහෙනව
උඹට කලුවෙ හුඟක් හොරඳ හැන්දෑවට නින්ද යනව
අඳුර ඇවිත් මගෙ නළලට නම් මන්තරයක් කියනව
ඒ එක්කම ඇහැ පියවිල එළිවෙන තුරු නින්ද යනව

මෙහි පළමු පාදය ගුරකින් පටන් ගන්නා අතර දෙවන සහ තුන්වන පාද ලඝුවලින් ද හතරවන පාදය ගුරකින්ද පටන් ගැනේ. ඉහත අර්ථ දැක්වීම අනුව මෙම කවියද මුල් ගුර බිඳීමේ දෝෂයට හසුව ඇත.

41 වන පිටට